# ප්‍රධාන ලේකම් කාර්යාලය - වයඹ පළාත
பிரதம செயலாளர் அலுவலகம் - வடமேல் மாகாணம்
## Chief Secretary's Office – North Western Province
පළාත් සභා කාර්යාල සංකීර්ණය, කුරුණෑගල மாகாண சபை அலுவலகத் தொகுதி, குருணாகல் Provincial Council Office Complex, Kurunegala
ආයතන හා පරිපාලන අංශය தாபனமும் நிறுவாக பிரிவு Establishment and Administration Division


මගේ අංකය / எனது இலக்கம் / My No: NWP/CS/AD/22/10/1

ඔබේ අංකය / உமது இலக்கம் / Your No:

දිනය / திகதி / Date: 2023.02. 07

වයඹ ආණ්ඩුකාරවර ලේකම්,
සභා ලේකම් - වයඹ පළාත් සභාව,
ලේකම් - වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
සියළුම පළාත් අමාත්‍යාංශ ලේකම්වරුන්,
සියළුම නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරුන්,
සියළුම පළාත් දෙපාර්තමේන්තු / ආයතන ප්‍රධානීන් වෙත.

**<u>චක්‍රලේඛ වයඹ පළාත් සභාවට අදාල කිරීම.</u>**

රාජ්‍ය පරිපාලන, ස්වදේශකටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශ ලේකම් විසින් 2022.01.01 දින සිට 2022.12.31 දින දක්වා ආයතන සංග්‍රහයේ විධිවිධාන සංශෝධනය කිරීම සඳහා නිකුත් කර ඇති පහත සඳහන් චක්‍රලේඛ මඟින් සිදු කරන ලද සංශෝධනයන්, ආයතන සංග්‍රහයේ සුදුසු පරිදි සටහන් ඇතුලත් කිරීමට පියවර ගැනීම සඳහා රාජ්‍ය පරිපාලන, ස්වදේශකටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශ ලේකම් විසින්, රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ - 2022 මැයෙන් 2023.01.12 දිනැතිව නිකුත් කරන ලද අංක: 01/2023 දරණ චක්‍ර ලේඛය වයඹ පළාත් සභාවට අදාල කිරීම සඳහා ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය 2023.01.23 දින ලබා දී ඇති බව ආණ්ඩුකාරවර ලේකම්ගේ අංක: NWP/GOV/AD1/1/1/17/1 හා 2023.01.29 දිනැති ලිපියෙන් මා වෙත දන්වා ඇත.

02. මෙම චක්‍රලේඛ, <u>www.pubad.gov.lk</u> යන වෙබ් අඩවියෙන් භාගත කර අවශ්‍ය කටයුතු කරන ලෙස කාරුණිකව දන්වමි.

| අ/අ | චක්‍රලේඛ අංකය | නිකුත් කළ දිනය | කාරණය | යොමුව |
|---|---|---|---|---|
| 01 | 06/2022 | 2022.04.08 | අන්තර්ජාතික තරඟාවලියක විනිසුරුවරයෙකු වශයෙන් සහභාගී වීමට නිවාඩු ලබා දීම. | ආයතන සංග්‍රහයේ XII වැනි පරිච්ඡේදයේ 12 වගන්තිය |
| 02 | 18/2022 | 2022.09.09 | ආයතන සංග්‍රහයේ I වැනි කාණ්ඩයේ XII වැනි පරිච්ඡේදයේ වගන්ති සංශෝධනය කිරීම. | ආයතන සංග්‍රහයේ XII වැනි පරිච්ඡේදයේ 1,6,8,10 හා 21 වගන්ති |
| 03 | 28/2022 | 2022.12.17 | ජ්‍යෙෂ්ඨත්වයට හා විශ්‍රාම වැටුපට හානියක් නොවන පරිදි රාජ්‍ය නිලධරයන්ට ආචාර්ය උපාධිය හැදෑරීම සඳහා වැටුප් රහිත නිවාඩු ලබා දීම. | ආයතන සංග්‍රහයේ XII වැනි පරිච්ඡේදයේ 15:1:1 උප වගන්තිය |
| 04 | 29/2022 | 2022.12.17 | ආයතන සංග්‍රහයේ XIV වැනි පරිච්ඡේදයේ 30 වගන්තිය සංශෝධනය කිරීම. | ආයතන සංග්‍රහයේ XII වැනි පරිච්ඡේදයේ 30 වගන්තිය |

D:\චක්‍රලේඛ\Circulars.all\2023\01.2023.docx

| | | | | |
|---|---|---|---|---|
| 05 | 35/92(VI) | 2022.12.02 | රජයේ නිලධරයන් පිළිබඳව විනය පරීක්ෂණ ඉක්මන් කරවීම - ආයතන සංග්‍රහය සංශෝධනය කිරීම XLVIII පරිච්ඡේදය. | ආයතන සංග්‍රහයේ II වැනි කාණ්ඩයේ XLVIII වැනි පරිච්ඡේදයේ 19:5 උපවගන්තිය. |

අයි.කේ.එම්.එම්.එස්.ඉලංගසේකර,
සහකාර ප්‍රධාන ලේකම් I (පරිපාලන).

අ/කළේ: රංජිත් ආරියරත්න
ප්‍රධාන ලේකම්
වයඹ පළාත.